පොල්පිතිගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
----------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් උපලේඛණවල ගණනය කිරීම් වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් රු.81,408 ක්ද, ජංගම වත්කම් රු.16,976,796 ක්ද, ජංගම වගකීම් රු.12,218,828 ක්ද වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් මාසයට අදාල හිඟ උසාවි දඩ රු.384,250 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

සභාවේ සේවය කර විශ්‍රාම ගන්වනු ලැබූ විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින් වෙනුවෙන් සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානවන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.1,747,483 ක් විය. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු.15,474 ක් බැගින් එම අරමුදලට ගෙවනු ලැබූවද, එම මුදල් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) ජංගම වත්කම් යටතේ ඇති ව්‍යාපෘති ණයගැතියන් රු.585,824 ක ශේෂය වර්ෂය ආරම්භයේ සිට පැවතින.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.73,549,436 ක් විය. මින් ආසන්න වශයෙන් 0.24% ක් වූ රු.174,716 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වන අතර මේ තුල වසර 03 ත් 07 ත් අතර කාලයක සිට පවතින රු.54,519 ක් වූ මිශ්‍ර තැන්පතු ශේෂ 09 ක්ද, වර්ෂ 4 ත් 5 ත් අතර කාලයක සිට පවතින රු.95,197 ක විවිධ තැන්පතු ශේෂ 02 ක් ද පැවතුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.387,498 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,339,107 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.951,609 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.117,517,019 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.102,234,414 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.15,670,103 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.41,098,095 න් ආසන්න වශයෙන් 79% ක් වූ රු.32,664,629 ක් සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය.ප්‍රාග්ධන ආදායම වූ රු.117,517,019 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.40,710,598 න් ආසන්න වශයෙන් 71% ක් වූ රු.28,786,651 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් ආසන්න වශයෙන් 97% ක් රු.27,921,091ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ප්‍රාග්ධන වියදම වූ රු.102,234,414 න් ආසන්න වශයෙන් 1% ක් රු.569,467 ක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරි 99% ක් වූ රු.101,664,947 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,553,425 ක්ද මුද්දර ගාස්තු ප්‍රමාණය රු.6,409,594 ක්ද විය.

## 03 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

මෝටර් ග්‍රේඩරය, ටිපර් රථය, මාර්ග තලනය කෘෂ කැබ් රථය හා ට්‍රැක්ටරය ලියාපදිංචි කර රක්ෂණය කිරීමට පියවර නොගැනීම නිසා භාවිතා කර නොතිබුණි. එමෙන්ම වෙනත් වාහන 4 ක් සමාලෝචිත වර්ෂය තුල නිශ්ක්‍රිය තත්ත්වයෙන් පැවතුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය